


ඩී. එච්. වෙනායා මින්තුල

# සත්ව මිතුරෝ

ඩී. එච්. වෙනායා මින්තුලි

# සත්ව මිතුරෝ

කර්තෘ : ඩී. එච් චෙනායා මින්තුලි

5 - ශ්‍රේණිය D

මහ/මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කතා ප්‍රකාශනයකි.

පළමු මුද්‍රණය : 2023

පිට කවරය : ඩී. එච් චෙනායා මින්තුලි

කර්තෘගේ වෙනත් කෘති : පුංචි සිතක සතුට

ISBN Number – 978 – 624 – 206 – 731 – 5

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්‍ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදූහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 .11 . 01

# පිදුම

මා මෙලොවට බිහිකළ

ආදරණීය මෑණියන්ටත්,

හදා වඩා ඇති දැඩි කළ

පියාණන්ටත්,

මාගේ ගුරු මෑණියන්ටත්

ගෞරවයෙනි.

# ස්තූතිය

මෙවන් කතා පිංචක් නිර්මාණය කිරීමට මා
යොමු කළ මාගේ පාසලේ
ගරු විදුහල්පතිතුමියටත්, ආදරණීය
හඳා අතාවුද ගුරු මැණියන්ටත්, ආදරණීය
විද්‍යා කරන්නාගොඩ ගුරු මැණියන්ටත්,
ආදරණීය වාසනා විජේකෝන් ගුරු
මැණියන්ටත්, මට නන් අයුරින් සහය දුන්
මැණියන්ටත්, අත්තම්මාටත්, පවුලේ
සැමටත්,
මුද්‍රණ කටයුතු නිම කළ A One
සන්නිවේදන ආයතනයටත් හද බැතිනි!



එක්තරා කැලෑවක නරි පැංචෙකුයි, ඉබි පැංචියෙකු, ලේන් පැංචියෙකුයි, හිටියා. ඔවුන්ව රැක බලාගන්න හිටියේ ජිරාෆ් මාමා. ඒ කැලේ කැලෑ ඉස්කෝලයක් තිබුණා. පාසලේ ගුරුතුමිය කොටි දෙනක්, විදුහල්පතිතුමා අලියෙක්. වෙනදා වගේ ම මේ සිසු සිසුවියන් තිදෙනා ජිරාෆ් මාමාට ගාථා කියා වැඳ පාසල් ගියා. ඔන්න ඔහොම ටික දුරක් යනකොට එයාලා දැක්කා නපුරු පූස්හාමි කුරුලු පැංචාට යන්න දෙන්නෙ නැතුව එයාව කන්න ලෑස්ති වෙලා ඉන්නවා.



අනේ ! කවුරු හරි මාව බේරගන්න, මාව බේරගන්න කියලා කුරුලු පැංචා බයේ වෙවුල වෙවුලා අඬමින් කෑගහනවා. අහිංසක අසරණ කුරුලු පැංචාට මෙහෙම දෙයක් වෙලා තියෙද්දී ලේන් පැංචි කිවුවා මට නම් බැහැ එයාට උදවු කරන්න. ඔයාලා කැමති නම් එයාට උදවු කරන්න කියලා යන්න ගියා. ඒ දෙන්නා පූස් හාමිට ආදරයෙන් කරුණාවෙන් කිවුවා අනේ පූස්හාමි එයාට පාඩුවේ ඉන්න දෙන්න අපි ඔයාට ඇති වෙන්න තුන් වේලට ම කන්න කෑම දෙන්නම් කියලා. පූස්හාමි කල්පනා කරලා කරලා තමයි ඒ අදහසට එකඟ වුණේ. ඒ නිසා එයාලා දෙන්නට පාසල් යන්නත් පරක්කු වුණා. කුරුලු පැංචා එයාලාට ස්තූති කර පියඹා පාසලට ගියා.



පාසලේ උදෑසන රැස්වීමේ දී ළමුන් සියලු දෙනා ම පන්සිල් ගත් පසුව තමයි ඒ දෙදෙනා ඉස්කෝලෙට ආවේ. ගුරුතුමිය තරහෙන් ඔවුන්ගෙන් ඇහුවා, “ඇයි ඔයාලා වෙලා ගියේ බලන්න හැම ළමයෙක්ම ඉස්කෝලේ ඇවිත්. ඒත්, ඔය දෙන්නා විතරක් පරක්කුයි කියලාග” එයාලා ගොඩාක් බයෙන් අඬමින් කිවුවාල අනේ! ගුරුතුමී අපිට ඉස්කෝලේ එන්න වෙලා ගියේ පුස්හාමි කුරුලු යාවාව කන්න ගියා. අපි එයාට කිවුවා එයාව කන්න එපා අපි ඔයාට කෑම දෙන්නම් කියලා.



පුස්හාමි කල්පනා කරලා කරලා තමයි ඒ අදහසට එකඟ වුණේ කියලා යාළුවෝ දෙන්නා කිව්වා. ගුරුතුමිය ගොඩක් දුකෙන් කිවුවා අනේ! මට සමාවෙන්න මං කිසිම දෙයක් හොයන්නේ බලන්නේ නැතුව ඔයාලට බැන්නා කියලා. ඊට පස්සේ ගුරුතුමී ඒ සිද්ධිය විදුහල්පතිතුමාට කිවුවා. උදෑසන රැස්වීමේ අවසානයත් සමඟ ම විදුහල්පතිතුමා "දැන් අපි සූදානම් වෙන්නේ හොඳ ළමයින්ට තෑගි ප්‍රදානය කිරීමට" යැයි කිවුවා ය.
විදුහල්පතිතුමා ඉබි පැංචි සහ නරි පැංචා දෙස බැලුවා.

ඔවුන්ට තෑගි ප්‍රදානය කළා. ඒ දෙදෙනා ළමයිගෙන් ඉල්ලා සිටියේ තව තවත් හොඳ වැඩ කර පාසලට ඉතා විශාල ගෞරවයක් ගෙන දීමට ය. ළමයි ඉතා ප්‍රීතියෙන් ඔවුන් දෙදෙනාට ලොකු අත්පොළසන් නාදයක් දුන්නා.



විදුහල්පතිතුමා දෙදෙනාට ම ප්‍රසංසා කළා. ඉස්කෝලේ වැඩ කර කෑම කා නැවත ඉස්කෝලේ වැඩ කළ පසු ඔවුන් තිදෙනා ගෙදරට ගියා. නිවසට පැමිණ නරි පැංචා, ඉබි පැංචා, ජිරාෆ් මාමාට ගොඩක් සතුටින් කිවුවා, "මාමේල අද අපි දෙන්නා හොඳ වැඩක් කළාල ඒ නිසා අපිට තෑගි ලැබුණා".

ඇත්තට ඔයාලා දෙන්නා නම් හොඳ ළමයි ඉතින් මොනවද ලැබුණේ? ජිරාෆ් මාමා ඇහුවා. පාසල් උපකරණ, දෙදෙනා ම එක හඬින් කිවුවා. ජිරාෆ් මාමා

ඔවුන්ගේ හිස් අත ගෑවා ලේන් පැංචි ඇහුවාල "මාමේ..... මාමේ..... අපි විනෝද චාරිකාවක් යමුද මුහුදු වෙරළට? කියලා.



ඒක හොඳ අදහසක් දුවේ එහෙනම් අපි යමු ජිරාෆ් මාමා කිවුවා. ඊළඟ දවස උදා වුණා. ගමනට අවශ්‍ය දෑ රැගෙන බසයට නැග්ගා. මුහුදු වෙරළට ඉක්මනින් ළගා වුණා. වෙරළට ආ පසු ඔවුන් වටේට ඉඳගෙන මැදින් ගිනි මැලයක් ගසා සින්දුවක් කිවුවා. ගීත ගායනා කළ පසු නරි පැංචා සහ ජිරාෆ් මාමා මුහුදේ පීන පීනා හිටියා. ඉබි පැංචි සිප්පි කටු ඇහින්දා. ලේන් පැංචි වැලි මාලිගා සාදනවා. ඔන්න එකපාරටම මුහුදේ තිබු නිල් පැහැති රන්වන් වතුර බොර වෙන්න පටන් ගත්තා. එයාලා ඉක්මනට වෙරළට දුවගෙන ආවා. අර දෙන්නා ඇහුවාල ඇයි ඔයාලා පීන පීන හිටිය වෙලාවේ හදිස්සියේ ම මෙතනට ආවේ.



ඇයි ඉතින් මුහුදේ වතුර බොර පාට වුණා. ඒකයි අපි ආවේ ජිරාෆ් මාමායි නරි පැංචයි කිවුවා. එහෙම වෙන්නෙ මිනිස්සු මුහුදට අපද්‍රව්‍ය එකතු කරලා තියෙන නිසා ඉබි පැංචි කිවුවා. ඒක ඇත්ත ලේන් පැංචි කිවුවා හරි අපි ඒවා ඔක්කොම එකතු කරමු නරි පැංචා කිවුවා. එක හොඳ අදහසක් පුතේ, ජිරාෆ් මාමා කිවුවා.



එයාලා මුහුදු වෙරළෙ තිබුණු සේරම අපද්‍රව්‍ය මල්ලකට එකතු කරාග එතකොට මුහුදු වෙරළ පිරිසිදු ව ලස්සනට බැබළි බැබළි තිබුණාග අවසානයේ ඔවුන් ජය ගත්තාග



එකිනෙකාට උදව් වෙමින් සහයෝගයෙන් වැඩ කළ නිසා එම චාරිකාව සාර්ථක වුණා. මෙම විස්මිත අපුරු චාරිකාව පිළිබඳ ඔවුන් සටහන් පොතෙහි සටහනක් තබා ගත්තා.

පුංචි ළමුන් වන අපට ද මෙය මහඟු ආදර්ශයකි. එලෙස ක්‍රියා කරන්නට අපි ද අධිෂ්ඨානය කර ගෙන යහපත් සමාජයක් බිහි කිරීමට දායක වෙමු. දිනෙන් දින දියුණු වෙමින් පවතින වත්මන් සමාජය හැඩ ගස්වා ගන්නට මෙම සත්ව චර්යා ආදර්ශයට ගෙන එලෙස හැසිරෙමු.

තිරිසන් සතුන් පවා

සමඟියෙන් සිටින විට

මනුස්ස මිනිසුන් කිම ද

කුලල් කාගන්නේ

ජාති කුල මල


භේද දුරලා

මව්බිම රැකුමට උර දෙමු

අපි එකාවන්ව.

නිමි.......

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ජුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක